


සහන් වීරසේකර

# ගුවන් විදුලියේ ක්‍රිකට් මහා කොමසාරිස් හෙවත් පාලි

ලාංකීයත්වය අප ජීවත්වන වන ධරණී තලය මත ඉස්මතු වන හෝ එසේ ඉස්මතු වුන හෝ, මතක කාල වපසරියක, ක්‍රිකට් (Cricket) සහ ලාංකීය මුළුදෙටු ව්‍යංජන (Curry) යනු ලංකාවේ මුහුදු තීරයෙන් ඔබ්බට ලෝක ප්‍රජාව තුළ ලාංකීය ගුණය අරුත් ගැන්වුනු හෝ රස ගැන්වුනු, පිටරැටියාගේ කෙළ උනන හෝ කෙළ හැලෙන, සංස්කෘතික ප්‍රභේදයක ජීවමාන ලකුණු වේ යයි මට සිතේ.

සුපවේදී පබිලිස්ගේ සිට ලෝක පදක්කම් ලාභී සුපවේදීන් බොහොමයි. ඉන්දියානු උප මහාද්වීප සංස්කෘතියේ ආගමට දෙවෙනි වූ ඇදහීමක් වේ නම් ඒ ක්‍රීඩාව වේ. ක්‍රිකට් යනු එහි අග්‍රඵල උක්දඩු රාවයයි. ලාංකීය ක්‍රිකට් ක්‍රීඩාවේ පතාක යෝදයෝ බොහෝ දෙනෙක් ක්‍රීඩා පිටිය තුල හෝ තණතිල්ල මත පෑ දස්කම් විස්කම් එමටය. ඒත් ජාතියකට ක්‍රිකට් ඇසීමට වඩා කැවීමට සමත් වූ ප්‍රේක්ෂක රසවින්දනය උදෙසා දිව මතුරක් සේ වපුරාලන්න ඇප කැප වුයේ නම් එහි එක් යුග පුරෝගාමියෙක් වනුයේ අන් කවුරුත් නොව "අපි නොදන්න ක්‍රිකට්" රටට කියාදුන් ගුවන් විදුලියේ "පාලි" හෙවත් ලක්වැසි ගෞරවයට පත් ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී පාලිත පෙරේරාය.

මාධ්‍යවේදී අසෝක තිලකරත්න වැනි ගුවන් විදුලියේ බොහෝ ඇසූ පිරූ අය හට ඔහු නිබඳ "පාලි" විය. ජීවමාන ලාංකීය ක්‍රිකට් විශ්වකෝෂය ඔහුය. ගමට ක්‍රිකට් උණ ඇති කලේ පාලි කිවුවොත් නිවැරදීය. ගුවන් විදුලියේ කරුණාරත්න අබේසේකරගෙන් පසු ක්‍රිකට් ක්‍රීඩාවේ අන්දරය රටට කියූ රේඩියෝ වීරයා, කුරුප්පුගේ පාලිත චන්ද්‍රසිරි පෙරේරා හෙවත් අපේ පාලිත පෙරේරා. ඒ සේවයට ජාතියේ ගෞරවය හෝ ප්‍රමාණාත්මක ඇගයීමක් මෙතෙක් හිමි නොවූ උත්තම පුරුෂයා ද අන් කවරකුවත් නොව "අපේ පාලි" ය.

මීට වසර 54 කට (1963 වසරේදී) පෙර පාලි විසින්ම ආරම්භ කරන ලද ආනන්ද -නාලන්දා මහා ක්‍රිකට් ගැටුමේ පන්දුවෙන් පන්දුව විස්තර විචාරය යනු ඔහුගේ ක්‍රිකට් ජීවිතයේ පළමු විකාශ කතිකාවයි. මෙරට ගුවන්විදුලියේ සජීව ක්‍රිකට් විස්තර ප්‍රචාරයට පුරෝගාමී වූයේ පාලිත පෙරේරා ය. 1982 දී ජාතික රූපවාහිනිය මෙරටට හඳුන්වා දීමත් සමගම පාලි එම මාධ්‍යයේ ද පළමු ක්‍රිකට් විස්තර ප්‍රකාශකයා බවට පත්වූයේය. විස්තර විචාර අට්ටාල ඉතිහාසය ඇතිවූ එකල්හී එළිමහනේ ගස් යට හිඳ කරන රේඩියෝ කථාසල්ලාපයේ යෙදුනු නිවේදක මහත්වරු අව් රස්මිය මැකෙන්න හිසට ඉහලින් අටවන ලද ටකරන් වහලක් සහිත මඩුවක් විය. එයද ඉංග්‍රීසි සේවාවට මුල් තැන දුන් යුගයක පාලි වැට කඩුලු පැන සෙයිලමෙන් ගම්මණ්ඩියේ සිත් වලට ක්‍රිකට් ආරෝපණය කල, ගුවන් විදුලියේ ඔස්සේ වැඩි වචන දේවතාවා යයි මට හැඟේ.

වරක නවසීලන්තය සහ ශ්‍රී ලංකාව අතර තරගයක් කොළඹ එස්.එස්.සී. ක්‍රීඩාංගණයේ තිබුනා. ඉතින් පාලිතත් විස්තර විචාරයට ගියා. විස්තර අට්ටාලය තුල වන රසවත් සිදුවීම් බොහොමයි. සමහර නිවේදකයන්ට වචන රූරාබහිනවා. සමහරු තෝරාගත් වචන කට්ටලයක් අට්ටාලය තුල අනනවා සහ විටෙක අනාගන්නවා. හැබැයි අපේ පාලිතට තරම් ක්‍රීඩාංගනයේ පෙනෙන සියුම් රූපමය සහ රූපක ආශ්‍රිත සම්බන්දතා වල ඇසිදිසි මානය, වචන පෙළපාලියකට පෙරලා ක්‍රිකට් ක්‍රීඩාවේ ජන ස්වීන්දනය තුලට කා වැද්දවීමේ ශක්තිය දැඩිව අනෙකෙක් අහල පහළ නැත. ඔහුටම ආවේනික ශබ්දලීලාව සහ ප්‍රකාශන හුරුව අසමසම යයි බොහෝ දෙනෙක් ගේ මතයයි. පාලි විස්තර විචාරයට ගියාම විටෙක දුම්මල වරම ගත්තා වගේ. පන්දුවත් පිත්තත් එක්කම තමයි ඉන්නෙ. ඩමේ පිට්ටනියෙ තණතිල්ල මත පක්ෂීන් තුන්දෙනෙක් ඉන්නවා. දෙන්නෙක් ක්‍රීඩා කරනවා. එක්කෙනෙක් හිටගෙන බලාගෙන ඉන්නවා. එක්කෙනෙක් මාටින් ක්‍රෝ, එයා මාටින් කපුටා. අනිත් එක්කෙනා ජෙෆ් ක්‍රෝ. එයා ජෙෆ් කපුටා. මේ කපුටෝ දෙන්නාම දෙස බලන් ඉන්න අනෙක් කුරුල්ලා, විනිසුරු ඩිකී බර්ඩ්. එයා ඩිකී කුරුල්ලා. යනුවෙන් විස්තර කළේ ඇගට නොදැනීය. ඒ පාලිතගේ හැටිය. එය අසා සිටි සෙසු විස්තර විචාරකයන් යටි බඩ අල්ලගෙන සිනා වන්නට විය.

පාලිතගේ ක්‍රිකට් අන්දර අතර පකිස් පොලිස් කතාවක් තිබුණා. 1992 දී බන්දුල වර්ණපුරයි, පාලි සහ වජිර විජේවර්ධනයි ගියා පකිස්තානයේ තිබුණ තරගාවලියක් ආවරණය කරන්න. ඒ තරගය තිබුණෙ රාවල්පින්ඩිවල අලුතින් හදල තිබුණ ක්‍රිකට් ක්‍රීඩාංගණයක. හැබැයි ඒ ක්‍රීඩාංගණයේ වැඩ ඉවර වෙලා තිබුණෙ නැහැ. තරගය බලන්න අතුරු සිදුරු නැතිව සෙනග ක්‍රීඩාංගණයට ඇවිල්ල හිටියා. තවත් විශාල පිරිසක් එළියෙ ඉන්නවා ඇතුළට එන්න බැරිව.

ටික වේලාවක් යන කොට එළියෙ හිටපු ප්‍රේක්ෂකයෝ ක්‍රීඩාංගණය හදන්න ගෙනල්ල තිබුණ ගඩොල්වලින් ක්‍රීඩාංගණය ඇතුලට ගහනවා. ඔන්න ඉතින් පාලිත හිටපු ක්‍රීඩා විස්තර මණ්ඩපයටත් ගඩොල් කැට ආවා. පස්සෙ සිදුවීම හොයල බලන විට එළියෙ ඉඳල තියෙන්නෙ තරගය බලන්න ප්‍රවේශපත්‍ර අරගත්තු මිනිස්සු. ඒ අයට ඇතුළට එන්න විදිහක් නැත්තෙ පකිස්තාන් පොලිසියෙ කට්ටිය ටිකට් නැති මිනිස්සුන්ගෙන් සල්ලි අරන් ඇතුළට දාපු නිසා. ටිකට් ගත්ත කට්ටිය එළියෙ. කොහොම හරි පොලිසියෙන් ඇවිල්ලා කඳුළු ගෑස් ගහල තමයි ගැටුම නැවැත්තුවෙ. තරගය පටන් ගන්න ඉස්සෙල්ල ක්‍රීඩාංගණය ඇතුළෙ ගඩොල් තිබුණ ලොරියකට පටවන්න තරම්. මැච් එක ඉවර වෙලා අපි යනකොට ඇතුළෙ තිබුනා.

සවස වටින කාපට් වගයක් රෝල් කරගෙන පොලිසියෙන් කරේ තියන් අරන් යනවා. හොඳ පුටු එහෙමත් ඒ අය උස්සගෙන යනවා. මේක දැකල පාලි පකිස්තාන් ජාතික ලකුණු සටහන්කරුගෙන් ඇහැව්වා. "බලන්නකෝ, මේ උසස් පොලිස් නිලධාරීන් කොච්චර හොඳද. ඒ අය තරගය ඉවර වෙච්ච ගමන් අස්පස් කරන හැටි" කියලා. පස්සෙ ලකුණු සටහන්කරුවා කිව්වා, "නැහැ සර් ඒ අය අස්පස් කරනව නෙමෙයි, ඒවා ඒ අය ගෙදර අරන් යනවා" කියල. පකිස්තානයේත් පොඩ්ඩක් නීතිය එහාට මෙහාට නැවෙන්නේම නැතුව නෙමෙයි, කියා පාලිතට හොරෙන්ම කියවුනා. පුංචි හීං දාඩියක් දැම්මා.

බන්දු කීයද පන්දු...පාලි අසයි. බන්දුත් නාලන්දේ වගේම 1962 සුලෝහිත සංග්‍රාමයේ ක්‍රීඩා කල පාලි, වචන සහ පුද්ගල සම්බන්දය වාග් මාලාව තුල මැනවින් පෙන්නුම් කලා. වරක ශ්‍රී ලංකාවේ පළමු ටෙස්ට් ක්‍රිකට් නායක බන්දුල වර්ණපුර තරග තහනමකට ලක්වන්නට පෙර සහභාගි වූ අවසන් ටෙස්ට් තරගයේ මතකය අවදි කළ පාලිත, "1982 දී අපි ඉන්දියාවෙදි සහභාගි වූ පළමු ටෙසට් තරගය. ඒ කාලෙ අපේ රූපවාහිණිය වර්ණ. ඒත් ඉන්දියාවෙ කළු සුදු. ඒ තරගය ඉන්දියාව පරාද වෙන්න ගිහිල්ල අනූ නවයෙන් බේරුණා. මට මතක හැටියට සුනිල් ගවස්කාර්ව වට කරල පන්දු යවපු එකම ඉනිම ඒක වෙන්න ඇති. පන්දු යවන්නා හැරුණු කොට අනිත් සේරම ගවස්කාර් වටේට තියල තමයි පන්දු රැක්කේ.

පස්සෙ බොහොම අමාරුවෙන් ඉන්දියාව තරගය ජය පරාජයෙන් තොරව අවසන් කරගත්තා. මම තරගය ඉවර වුණ ගමන්ම ගවස්කාර්ලාගෙ විවේකාගාරයට ගියා. එතනට යනකොට ගවස්කාර් කකුලක් පුටුව උඩට තියාගෙන පා ආවරණ ගලවන ගමන් කේන්තියෙන් කියනවා මේ පොඩි කොල්ලන්ගෙන් අපිට ගොඩක් දේවල් ඉගෙන ගන්න තියෙනවාල කියලා. ඊට පස්සෙ තරගයේ විනිසුරුවන් මුණ ගැහෙන්න ගියා. මම එතනට ගියේ විශේෂයෙන් ඒ තරගයේ විනිසුරුවරයෙක් වූ ස්වරූප් ක්‍රිෂන්ව මහතා මුණ ගැහෙන්න. එයා පුංචි අලි පැටියෙක් වගේ. එතනට යනකොට ස්වරූප් වතුර ගේන කළ ගෙඩියක් කටේ තියාගෙන උඩබලාගෙන ගුඩු.. ගුඩු.. ගාලා වතුර බොනවා. ඒක දැකල මට හොඳටම හිනා ගියා. ඊට පස්සෙ එයා අල්ල පුරවල බුලත් විටක් අරගෙන කටේ ඔබා ගත්තා. මම ළඟට ගිහිල්ල ඇහුවා ඔබ විනිශ්චයක් දෙනකොට ගන්න ක්‍රමවේදය (Pause and Decide) මොකක්ද කියලා. එයා කිව්වා හොඳ හුස්මක් සහ හොඳ විරාමයක් අරගෙන තමයි තීරණය දෙන්නෙ කියලා. හැබැයි එයාගෙ තරම කිව්වොත් ලෙග් බයිස් එකක් දෙන්න කකුල උස්සගන්නවත් බැහැ. මෙයා 1992 දී පිළිකාවක් හැදිල මිය ගියා.

ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදියකු ලෙස හතරවැනි තට්ටුවට දෙවරක් කට උත්තර දීම සඳහා ගිය එකම මාධ්‍යවේදියා වන්නේද පාලිල.

"මම ඒ කාලෙ ගුවන් විදුලියේ වැඩ කරන ගමන් පුවත්පත්වලට ලියන්න ගත්තා. ක්‍රිකට් පමණක් නොවෙයි. කෙටිකතාත් ලිව්වා. මම කල්පනා සගරාවට ලියන ගමන් බන්දුල වර්ණපුරලගෙ තරග තහනම මුල සිට අගට ලිව්වා. රාජ්‍ය බලපෑම නිසා කවුරුත් මේ සිදුවීම ලියන්න ගියේ නැහැ. ටෝනි ඕපාත තමයි මේක පිටිපස්සෙ හිටියෙ. එයාවත් ලංකාවට ගෙන්න ගෙන වර්ණපුරවයි ටෝනිවයි ඉන්ටවිව් කරල මම කතාව ලිව්වා. අයහ හෙවත් ඇයි, යන්න පසුපස මාධ්‍යවේදියකු ලෙස වරක් නො දෙවරක් සිතන්න ඔහුගේ ආමන්ත්‍රණය ඉඩ දුන්නා.



මම ටෝනිගෙන් ඇහුවා කොහොමද පසුබිම ඇතිවුණේ කියලා. එයාත් ඇද නැතිව මට කිව්වා ඒ කාලෙ ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය සහ කණ්ඩායමේ අවබෝධය බිඳිල තිබුණෙ. මට හිතුනා මේ අවස්ථාව තමයි හොදම අවස්ථාව කියල මේක සැලසුම් කළා. දුලිප් මෙන්ඩිස්ට සහ රෝයි ඩයස්ට මුලින්ම කිව්වා. ඒත් දුලිප්ලගෙ ගෙදර තිබුණ පාටියකදි මේක ලීක් වුණ හින්ද අන්තිම මොහොතෙදි, මේ දෙන්න ඒ කියන්නේ දුලිප්,රෝයි කර ඇරිය නිසා වර්ණපුරට කතා කළා කියල, එයා කිව්වා. මම ඇහැව්වා බන්දුලගෙන් දුවන කෝච්චියට බෙල්ල තිබ්බෙ ඇයි කියලා. එයා කිව්වෙ මම කවදාවත් යන්න හිටපු ගමනක් නෙමෙයි මේක. පාලක මණ්ඩලයේ ඒකාධිපති පාලනය නිසා ඇතිව තිබූ දරදඬු පාලනයට පොඩ්ඩක් රිදවන්න සහ කොනිත්තන්න මේ සංචාරය ගියා කියල.

37 පිටට